**නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය (US$ 5.74 Mn) - 2021**

---

නාගරික ව්‍යාපෘති පිළියෙල කිරීමේ ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3706 එස්ආර්අයි (සීඑීඑල්) දරන ණය පහසුකම් ගිවිසුමේ 4.02 (ඒ) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රමුඛ නාගරික සංවර්ධන ව්‍යාපෘතිවල ඉහළ මට්ටමේ සූදානමක් ඇති කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 1,090.98 කට සමාන වූ එ.ජ.ඩො. මිලියන 5.74 ක් වන අතර ඉන් රු. මිලියන 883.88 කට සමාන වූ එ.ජ.ඩො මිලියන 4.65 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 මාර්තු 06 දින ආරම්භ කරන ලද අතර, 2022 මාර්තු 31 දින වනවිට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

---

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව | මුදල රු.මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 හි වගන්ති අංක 86 අනුව අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමක් සිදු කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ජූලි මස වන විට ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශන ආයතන 3 විසින් ව්‍යාපෘතිය වෙත ගෙවීමට ඉදිරිපත් කරන ලද රු. මිලියන 61.37 ක්, ඇ.එ.ජා.ඩොලර් 26,000 ක් සහ යූරෝ 41,206 ක අවසාන බිල්පත් පිළිබද කිසිදු හෙළිදරව් කිරීමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 61.3 | එකඟ වේ. උපදේශන ගෙවීම් සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීමෙන් පසු සහ හිමිකම් සමාලෝචන කමිටුව 2021 දෙසැම්බර් 31 දිනට කිසිදු අවසාන අනුමැතියක් ලබා දී නැත. එබැවින් කිසිදු ප්‍රතිපාදනයක් සිදු නොකළෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 37 අනුව අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කළ යුතුය. |
| 02. | ව්‍යාපෘතියේ උප කාර්යාල පවත්වාගෙන යනු ලැබු නගර 4 හි පිහිටි කාර්යාලවල භාවිතයට ගත් රු.මිලියන 7.3 ක දේපළ, පිරියත | 7.3 | මූල්‍ය ගිවිසුම අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය වසා දමා නොතිබුණු අතර ව්‍යාපෘතිය අවසාන වන | එම දේපළ පිරියත හා උපකරණවල අගය ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් |

| | | | | |
|---|---|---|---|---|
| | | හා උපකරණ අදාල නගර සභා වෙත 2020 දෙසැම්බර් 31 දින වන විට භාරදී තිබුණද එම වටිනාකම් ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | තෙක් මෙම වත්කම් තබා ගත යුතුය. (වර්තමානයේදි රජයේ විසින් ව්‍යාපෘති කාලය 2024 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර ඇත. ) | කළ යුතුය. |

**2.2** **නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>(i) මු.රෙ 225 (1) | සියලුම ගෙවීම් සඳහා නියමිත අකෘති පත්‍රවල නිවැරදි ලෙසත්, සම්පූර්ණ ලෙසත් පිළියෙල කරන ලද වවුචර් ඉදිරිපත් කළ යුතු වුවත් රු.409,055 ක් වටිනා වවුචර් 09 ක දිනය යොදා නොතිබුණි. එසේම රු. මිලියන 1.3 ක් වටිනා චෙක්පත් 13 ක් ලබාදීමේදි අදාළ වවුචර්පතෙහි අත්සන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වේ. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |
| | (ii) මු.රෙ 757 | සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය 2022 පෙබරවාරි මාසයේදි සිදු කර ගිණුම්ගත කර ඇත. | මුදල් රෙගුලාසි අනුගමනය කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය | ක්‍රියාකාරකම | 2021 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්යසාධන ප්‍රතිශතය | 2021 දෙසැම්බර් 31 දිනට ළඟා කරගෙන ඇති කාර්යසාධන ප්‍රතිශතය | විගණන නිරීක්ෂණය |
|---|---|---|---|---|---|
| (1) | සංවර්ධන වියදම් | උපදේශන සේවා | 100 | 50 | 2020 ඔක්තෝබර් මස වනතුරුත් උපදේශන වාර්තා ඉදිරිපත් කර නොතිබුණද කිසිදු ප්‍රමාද ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. |
| (2) | සංවර්ධන වියදම් | උපදේශන සේවා | 100 | - | උපදේශන ආයතන විසින් උපදේශන වාර්තා 21 ක් ව්‍යාපෘතියට ලබා දී මාස 6 ත් 24 ත් අතර කාලයක් ගත වී තිබුණද ව්‍යාපෘතිය විසින් එම වාර්තා 2022 ජූනි වන විටත් සමාලෝචනය කර නොතිබුණි. උපදේශන වාර්තා සමාලෝචනය කිරීම සඳහා නිසි සැලැස්මක් නොතිබීම මෙයට සෘජුව බලපා තිබුණි. |

**කළමනාකරණයේ ප්‍රතිචාරය**

(1) ගිවිසුමේ කොන්දේසි අනුව උපදේශකයින්ගෙන් ප්‍රමාද ගාස්තු අයකළ නොහැක.

(2) එකඟ වේ.

**විගණකගේ නිර්දේශයන්**

ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කිරීම සඳහා ශක්තිමත් හා කාර්යක්ෂම උපදේශන කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.

### 3.2 අරමුදල් ඌන උපයෝජනය සම්බන්ධ ගැටළු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 01. | ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමට සමාලෝචිත වර්ෂය තුළ ලද රු.මිලියන 133.9 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.679 කින් රු.මිලියන 144.52 කට සමාන එ.ජ.ඩො. මිලියන 0.737 ක් | එකඟ වේ. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලන පද්ධතිය ක්‍රියාත්මක කළ යුතු අතර විචලතාවයන් |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළ වියදම් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 4.32 කට සමාන එ.ජ.ඩො. 21,574 ක් විශේෂ ඩොලර් ගිණුමේ ඉතිරිව පැවතුණි. | | වගකිව යුතු නිලධාරීන්ට කාලෝචිත ලෙස වාර්තා කළ යුතුය. |
| 02. | සමාලෝචිත වර්ෂය සඳහා රජයේ අයවැය ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද රු.මිලියන 540 කින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 174.79 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබූ අතර එය ඇස්තමේන්තු ගත මුදලේ ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක අගයක් ගෙන තිබුණි. | එකඟ වේ. මෙයට ප්‍රධාන හේතුව වූයේ අයවැය ප්‍රතිපාදන ඉල්ලන අවස්ථාවේ උපදේශන සේවා නතර කිරීමේ අදහසක් නොතිබීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස අපේක්ෂිත වියදම් සිදු නොවීය. | අරමුදල් කාර්යක්ෂමව භාවිතා කිරිම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම සමග අරමුදල් උපයෝජන සැලැස්ම ඇතුළත් කළ යුතුය. |
| 03. | ඉහත තොරතුරු අනුව, ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් වෙන්කරන ලද රු.මිලියන 1,064.79 කට සමාන එ.ජ.ඩො. මිලියන 5.27 ක මුළු අරමුදල්වලින් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට මාස 33 ක් ඉකුත් වූ පසු එනම්, 2021 දෙසැම්බර් 31 දිනට මුළු වෙන්කිරීමෙන් සියයට 38 ක් නියෝජනය වන රු.මිලියන 406.27 කට සමාන එ.ජ.ඩො. මිලියන 2.07 ක් පමණක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. | එකඟ වේ. භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව කෝවිඩ් වසංගතය හේතුවෙන් 2020 වර්ෂය මැද භාගයේදී ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු නතර කිරීමට සිදුවීම, කාර්ය සාධනය හා වියදම් ළඟා කර නොගැනීමට ප්‍රධාන හේතුව විය. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලන පද්ධතිය ක්‍රියාත්මක කළ යුතු අතර විචලතාවයන් වගකිව යුතු නිලධාරීන්ට කාලෝචිත ලෙස වාර්තා කළ යුතුය. |

**3.3 මතභේදාත්මක ස්වරූපයේ කරුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 අගොස්තු 18 දිනැති හා අංක ER/AB/US/01(vol-i) දරණ ලිපිය අනුව, උප ව්‍යාපෘති 3, 2020 ඔක්තෝබර් 12 දින සිට අත්හිටුවා තිබුණි. ඒ වන විට එම ව්‍යාපෘති සඳහා වැය කළ රු. මිලියන 413.36 ක මුදල සම්බන්ධයෙන් කළ විමසීමට, ප්‍රතිචාරය වශයෙන් ව්‍යාපෘතිය යළි සක්‍රිය කර ඇති බවත් එම කාර්යයන් යොදා ගනිමින් නව සැලැස්ම ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බවත් ප්‍රකාශ කර තිබුණි. කෙසේ වෙතත් 2022 ජුනි 20 දින වන විටත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීම මත දරන ලද උක්ත වියදම නිෂ්කාර්ය වියදමක් විය හැකි බව විගණනයේදි නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය නැවත සක්‍රිය කර ඇති බැවින් කළින් උපදේශකයන් විසින් දැනටමත් සිදුකර ඇති කාර්යයන් ප්‍රයෝජනයට ගෙන නව සැලැස්ම සමඟ ඉදිරියට යාමට තීරණය විය. | උප ව්‍යාපෘති වහා ක්‍රියාත්මක කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය. |